# සාමාන්‍ය සමයේ විසිනවවන සතිය
# බදාදා

## පළමුවන කියැවීම

ශුද්ධවූ පාවුලු තුමන් විසින් රෝමවරුන්ට ලියන ලද හසුනෙන් කොටසකි.

රෝම 6 : 12-18

"උත්ථාන වූ අය මෙන් ඔබේ ඉඳුරන් දෙවියන් වහන්සේට කැප කරන්න."

ඔබ කායික තෘෂ්ණාවලට අවනත නොවන ලෙස මින් මතු ඔබගේ මැරෙන සුලු ශරීරයෙහි පාපය රජකම් නොකෙරේවා. තවද ඔබේ ඉන්ද්‍රියයන් අධර්මිෂ්ඨකමේ ආයුධ වන ලෙස පාපයට භාර නොදෙන්න. එසේ නොකර මළවුන් කෙරෙන් උත්ථාන වූ අය මෙන් දෙවියන් වහන්සේට කැප වී, ඔබේ ඉඳුරන් ධර්මිෂ්ඨකමෙහි ආයුධ වන ලෙස උන් වහන්සේට භාර කරන්න. මින් මතු ඔබේ ස්වාමියා, පාපය නොවේ. මන්ද, ඔබ නීතිය යටතෙහි නොව, දේව වරප්‍රසාදය යටතෙහි වන බැවිනි.

එසේ නම් කුමක් කරමු ද? නීතිය යටතෙහි නොව, දේව වරප්‍රසාදය යටතෙහි සිටින බැවින් අපි පව් කරමු ද? කොහෙත්ම නැත. ඔබ යමෙකු යටතේ වහල් සේවයට බැඳුණොත්, ඔබ ඒ ස්වාමියාගේ දාසයන් වන බව නොදන්නහු ද? පාපය ඔබේ ස්වාමියා වුවහොත් එහි විපාකය මරණය වේ. දෙවියන් වහන්සේට කීකරුකම ඔබේ ස්වාමියා වුවහොත් එහි විපාකය දේව සබඳතාව වේ. වරක් පාපයට දාසයන්ව සිටි ඔබ, දැන් ඔබට බාර දී ඇති ඉගැන්වීමට මුළු සිතින් කීකරු වූ බැවින් දෙවියන් වහන්සේට ස්තුති වේවා. ඔබ පාපයෙන් නිදහස ලැබූ විට ධර්මිෂ්ඨකමේ දාසයෝ වූවහු ය.

දේව වචනය මෙසේ ය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 124 : 1-8

පිළිතුර: අපගේ පිහිට සමිඳාණෝ ය.

ගීය:

ඉශ්රායෙල් මෙසේ කියත්වා "අපේ පැත්තට සමිඳාණෝ නොසිටි සේක් නම්, අපට විරුද්ධව සතුරන් නැඟිට ආ කල, අපේ පැත්තට සමිඳාණෝ නොසිටි සේක් නම්, ඔවුන්ගේ උදහස අපට විරුද්ධව ඇවිළුණු කල අප පණ පිටින් ගිල ගන්නට ඔවුන්ට ඉඩ තිබිණි.

එවිට ජලයෙන් අප වැසී යන්නට ඉඩ තිබිණි. දිය දහරින් අප යටකොට ගසාගෙන යන්නට ඉඩ තිබිණි.
අපේ සතුරන්ට අප ගොදුරු වීමට ඉඩ නුදුන් සමිඳාණන්ට ප්‍රශංසා වේවා

පක්ෂි වැද්දාගේ උගුලෙන් ගැලවී යන පක්ෂියෙකු මෙන් අපි මිදුණෙමු.
උගුල බිඳී ගියේය. අපි ගැලවුණෙමු.
අපේ පිහිටට ඇත්තේ, අහසත් පොළොවත් මැවූ සමිඳුන්ගේ නාමය ය."

## සුබ පුවත් ජය නද (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
මාගේ බැටළුවෝ මාගේ කටහඬ අසති. මම ද ඔවුන් අඳුනමි.
ඔව්හු ද මා පසුපස්සේ එති යි සමිඳාණෝ වදාරන සේක.
ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!
ස්වාමීන් වහන්සේ ඔබ බලාපොරොත්තු නොවන පැයක දී වඩින බැවින් ඔබත් සූදානම් ව සිටින්න.
ආලේලූයා!

## සුවිශේෂය

ලූක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

ලූක් 12: 39-48

"යමෙකුට බොහෝ දේ දෙන ලද්දේ ද ඔහුගෙන් බොහෝ දේ අපේක්ෂා කෙරේ."

"සොරා කොයි පැයේ දී එන්නේ දැයි ගෙදර ස්වාමියා දැන සිටියේ නම්, ඔහු නොනිදා හිඳ, තමාගේ ගෙය බිඳීමට ඉඩ නොදෙන බව දැන ගන්න. එබැවින් ඔබ සූදානම්ව සිටින්න. මෙසේ කියන්නේ ඔබ බලාපොරොත්තු නොවන පැයක දී මනුෂ්‍ය පුත්‍රයාණන් වඩින නිසා ය.

එවිට පේදුරු කතා කරමින් "ස්වාමිනී මේ උපමාව වදාරන්නේ අප උදෙසා ද, නැතහොත් සියල්ලන් උදෙසා දැ"යි උන්වහන්සේගෙන් ඇසීය. එවිට ස්වාමින් වහන්සේ මෙසේ පිළිතුරු දුන් සේක. "ඉඳින් ස්වාමියා විසින් තම ගෙයි වැසියන්ට නියම වේලාවට ආහාර කොටස සපයන පිණිස ඔවුන් කෙරේ පත් කරනු ලබන විශ්වාසී, සිහි නුවණ ඇති ගබඩාකාරයා කවරෙක් ද? ස්වාමියා ආ කල යම් දාසයකු සිය සේවයෙහි යෙදී සිටින ඔහු දුටුවොත් ඒ දාසයා භාග්‍යවන්තයෙක් ය. ඒ ස්වාමියා තමා සන්තක සියල්ල කෙරෙහි ඔහු පත් කරන්නේ යයි ඇත්තෙන්ම මම කියමි. එහෙත් ඒ දාසයා "මාගේ ස්වාමියාගේ ඊම පමාවනු ඇතැ"යි සිතමින් දැසි දසුන්ට පහර දෙන්නටත්, කා බී මත් වන්නටත් පටන් ගතහොත් ඔහු බලාපොරොත්තු නොවන දිනක දී, නොදන්නා පැයක දී ඒ දාසයාගේ ස්වාමියා අවුත් ඔහුට දරුණු ලෙස දඬුවම් කොට, අවිශ්වාසීන්ට නියම ඉරණම ඔහුටත් නියම කරන්නේ ය. සිය ස්වාමියාගේ අදහස දැනගෙනත් ඒ අදහස පරිදි කටයුතු සංවිධානය නොකළාවූ ද ක්‍රියා නොකළාවූ ද දාසයා බොහෝ පහර ලබන්නේය. එහෙත් ඒ අදහස නොදැන පහර ලැබීමට තිසි දේ කළ අය ස්වල්ප වශයෙන් පහර ලබන්නෝය. යමෙකුට බොහෝ දේ දෙන ලද්දේ ද ඔහුගෙන් බොහෝ දේ බලාපොරොත්තු වනු ලැබේ. යමෙකුට බොහෝ දේ පවරන ලද්දේ ද ඔහුගෙන් ඊටත් වැඩියෙන් බලාපොරොත්තු වනු ලැබේ."

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.